සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

(පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus)

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

නැටුම් (භරත) I
நாட்டியம் (பரதம்) I
Dancing (Baratha) I

53 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* පිළිතුරු පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය, **පිළිතුරු පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

**1.** "ආනන්ද නඩමාඩුවාර් තිල්ලෙයි ..." යන කීර්තනයෙහි 'තානන්තමිල්ලාත රූපන්' යන්නෙහි සඳහන් කරන දෙවියන් වන්නේ,

(1) පාර්වතී ය. (2) සිවන් ය. (3) ගණපති ය. (4) මුරුගන් ය. (5) ලක්ෂ්මී ය.

**2.** 'පූ-පව' මත පදනම් වී ඇති නිර්මාණය වූයේ,

(1) රාගය ය. (2) රස ය. (3) තාලය ය. (4) හැඟීම් ය. (5) භාව ය.

**3.** වචන-මනස-ක්‍රියා යන ත්‍රිත්වය එක් වී නිර්මාණය වන්නේ,

(1) විරුත්ති ය. (2) නිරුත්ත වේ. (3) කරණ වේ. (4) අභිනය වේ. (5) භාව වේ.

**4.** සෑම කාන්තාවකගේම කැමැත්ත මත පාදක වූ එක හා සමාන ලෙස සලකන නායකයා වූයේ,

(1) සටන් ය. (2) තිරුෂ්ටන් ය. (3) දක්ෂිණන් ය. (4) පති ය. (5) අනුකූලන් ය.

**5.** උඩරට නර්තනයේ භාවාගේ පැනීම, වේගය සහ බියගුළු බව විදහා දැක්වෙන වන්නම

(1) නෛයියඩි වේ. (2) තුරඟා වේ. (3) උරගා වේ. (4) මුසලඩි වේ. (5) උකුසා වේ.

**6.** වේදිකාවේ දර්ශනයක එක් පේළියක් එක ආලෝකයක් හරහා පෙන්වීමට භාවිත කරන ආලෝකය වනුයේ,

(1) කුවින්ත ය. (2) පරප්පු ය. (3) කුරෙයි ය. (4) ප්‍රකාශ ය. (5) කීට්ටු ය.

**7.** නාට්‍ය ශාස්ත්‍රයෙහි අටවෙනි පරිච්ඡේදයෙන් කියැවෙන්නේ

(1) ශරීර අංග භාවිත කර අභිනය කරන විධි වේ.

(2) සංගීතය, රාග, තාල, තාලජදී ගැන වේ.

(3) තාල සංගීත භාණ්ඩ වේ.

(4) නර්තනය සාර්ථක කිරීම සඳහා අවශ්‍ය කරුණු ගැන වේ.

(5) චරිත තෝරා ගැනීමේ ක්‍රම වේ.

**8.** ඍග්, යජුර්, සාම, අතර්ව වේදවල සාරය ගෙන නිර්මාණය කළ කීවෙනි වේදයෙහි නර්තනය ඇතුළත් වේ ද?

(1) පළවෙනි (2) තුන්වැනි (3) හතරවෙනි (4) පස්වෙනි (5) හයවෙනි

**9.** 17 වෙනි සියවසේ අවසාන භාගයේදී කොට්ටාරකරෙයි රජු විසින් ක්‍රිෂ්ණා නර්තනය වෙනුවට ලියා රඟදැක්වූ නර්තනය වනුයේ,

(1) හනුමනාට්ටම් ය. (2) රාමනාට්ටම් ය. (3) තප්පාට්ටම් ය.
(4) මයිලාට්ටම් ය. (5) පුලි-ආට්ටම් ය.

**10.** මහාචාර්ය රාගවන් සහ අභිනය අරසි බාලසරස්වතී යන දෙදෙනා විසින් දමිළ භාෂාවෙන් රචිත නර්තන ග්‍රන්ථය වනුයේ,

(1) භරතනාට්‍ය ශාස්ත්‍ර ය. (2) අභිනයධර්පනම් ය.
(3) භරතනාට්‍යයම් ය. (4) භරතාර්ණවම් ය.
(5) කූතනූල් ය.

**11.** සංකීර්ණ ජාති කුරුවතාල ඛණ්ඩ ගදි ලෙස පරිවර්තනය වන විට එහි සංඛ්‍යාව වන්නේ,

(1) 29 කි. (2) 87 කි. (3) 145 කි. (4) 174 කි. (5) 203 කි.

**12.** කෙනෙකුගේ ශරීර ලක්ෂණ, බාහිර පෙනුම සහ හැසිරීම තුළින් ප්‍රකාශ වන ඔහුගේ ගුණයෙහි ලක්ෂණය වන්නේ,

(1) පාත්‍ර වේ. (2) අපාත්‍ර වේ. (3) කිංකිණි වේ. (4) සභා වේ. (5) සාමුද්‍රිකා වේ.

**13.** 108 තාණ්ඩම්වලින් තුනක් පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) භාව, ලලිත සහ තාල (2) නිරුත, රාග සහ චතුර
(3) පතාක, සුචි සහ නූපුර (4) තල පුෂ්පපුඩම්, ලලිත සහ චතුර
(5) අංජලි, ශකඩ සහ නිකුට්ටක

**14.** පරකියා නායිකාවන් වර්ග දෙක සඳහන් වරණය වන්නේ,

More Past Papers at
tamilguru.lk

(1) ධීරා සහ අධීරා (2) කන්‍යා සහ ප්‍රව්ඩා
(3) ගුප්තෛ සහ විදක්තෛ (4) ධීරාධීරා සහ අධීරා
(5) දාසි සහ ධීරා

**15.** 'පද්මභූෂන්' සහ 'සංගීත කලානිදි' යන ගෞරව නාමවලින් පිදුම් ලැබූ පළවෙනි නර්තන ශිල්පිනිය වන්නේ,

(1) මයිලාපූර් ගෞරි අම්මාල් ය. (2) ශ්‍රීමති රුක්මණිදේවි අරුන්ඩේල් ය.
(3) සොක්කම්මාල් ය. (4) පන්දනෛ නල්ලූර් ජයලක්ෂ්මි ය.
(5) අභිනය අරසි බාලසරස්වතී ය.

**16.** දේවහස්තවල ශන්මුගන් දෙවියන් පෙන්වීම සඳහා භාවිතා කරන වම සහ දකුණු හස්ත මුද්‍රා පිළිවෙළින්,

(1) ත්‍රිශූල සහ ශිකර වේ. (2) කටකාමුඛ සහ මයුර වේ.
(3) ශිකර සහ ත්‍රිශූල වේ. (4) පතාක, සහ ත්‍රිපතාක වේ.
(5) ශිකර සහ කටකාමුඛ වේ.

**17.** ශෘංගාර නායිකාවන්ගේ වර්ගවල දේව ලක්ෂණ සහිතව සිටින්නේ,

(1) මානවී ය. (2) දිව්‍යා ය. (3) මිස්රෛ ය. (4) සන්ඩි ය. (5) මුක්තා ය.

**18.** ග්‍රාමීය නර්තන වර්ග පමණක් ඇතුළත් කාණ්ඩය කුමක් ද?

(1) ඔයිලාට්ටම්, බොම්මලාට්ටම් සහ ඒන්දල් නඩනම්
(2) කුදිරෙයියාට්ටම්, ඔඩිසි සහ කතක්
(3) බැලෙ, මණිපුරි සහ ඒන්දල් නඩනම්
(4) ඔඩිසි, බොම්මලාට්ටම් සහ ඩිස්කෝ
(5) ඩිස්කෝ, ඔයිලාට්ටම් සහ මෝහිනියාට්ටම්

**19.** සංග යුගයේ මුල්ලෙල ප්‍රදේශයේ විසූ මිනිසුන් විසින් නර්තනය කරනු ලැබූ කුත්තු වන්නේ,

(1) කුණ්ඩ කුරවෙ ය. (2) වරික්කෝලම් ය. (3) වෙට්ටුවවරි ය.

(4) ආච්චියර්කුරවෙ ය. (5) සාක්කෛයර් කුත්තු ය.

**20.** ''හරිරිග මුක්තවදූ...'' යන අෂ්ඨපතියෙහි ''කාපි විලාස විලෝල විලෝචන ...'' හි යන පේළියේ සඳහන් 'ලෝචන' යන වචනයෙන් අදහස් වන්නේ,

(1) කම්මුල ය. (2) ඇස් ය. (3) තොල් ය.

(4) කුණ්ඩලම් ය. (5) මොණර පිහාටු ය.

**21.** පරමාත්මා වෙතට ජීවාත්මා කැඳවා ගෙනයන බුද්ධියේ ඇඳුරුතුමා ලෙස නිරූපණය වන්නේ,

(1) සාමාන්‍යයා ය. (2) ප්‍රකල්පා ය. (3) පරකීයා ය. (4) ස්වීයා ය. (5) දූතිකා ය.

**22.** ගුණාංග අනුව රාවණා සහ දුර්යෝධන වැනි අයට උදාහරණ වශයෙන් හඳුන්වන නායකයෙක් වන්නේ,

(1) ධීරෝධාතන් ය. (2) ධීරශාන්තන් ය. (3) ධීරෝත්දන් ය.

(4) ත්‍රිරුෂ්ඨන් ය. (5) ධීරලලිතන් ය.

**23.** පංචජාතියේ තදිගිනතොම් පේළියේ වර්ගවල ආදී තාලම්හි ;;;;;, තකතදිංගි / නතොම් තකතදිංගින / තොම් තකතදිංගිනතොම් // යන තාල අංගවල පිහිටා ඇති තදිංගිනතොම් අඩව්වේ ජාතිය වන්නේ,

(1) මිශ්‍ර ය. (2) කණ්ඩ ය. (3) සංකීර්ණ ය. (4) තිස්ර ය. (5) චතුස්‍ර ය.

**24.** නඩරාජ දේව රූප දර්ශනයේ තුන්ක්‍රියා (මුත්තොළිල්) වන්හි නිරත වී ත්‍රිමල (මුම්මලංගල්) දුරුකර විමුක්තිය ලබා දීම හඳුන්වන්නේ,

(1) පාසම් වේ. (2) තිරුවාසි වේ. (3) කපාලම් වේ. (4) සූලම් වේ. (5) අංගුසම් වේ.

**25.** කෝවිලේ සංචාරයේ දෙවෙනි වටයේ දී ශ්‍රී බලි දෙනවිට විලම්බ කාලයෙන් ගායනා කර සහ එම ගායනය අනුව කරනු ලබන නර්තන වර්ග කුමක් ද?

(1) පදම්, කීර්තන සහ ජාවලි ය.

(2) ලාස්යම්, තාණ්ඩවම් සහ මණ්ඩලම් ය.

(3) මණ්ඩලම්, කීර්තණම් සහ මල්ලාරි ය.

(4) තාණ්ඩවම්, මල්ලාරි සහ අෂ්ටපති ය.

(5) ජාවළි, පදම් සහ ලාස්යම් ය.

**26.** ශෘංගාර නායිකාවන් අතරින් 'සාධාරණ' යනුවෙන් හඳුන්වනු ලබන නායිකාව වන්නේ,

(1) පරකීයා ය. (2) පෞඪා ය. (3) ස්වීයා ය. (4) සාමාන්‍යා ය. (5) ප්‍රකල්පා ය.

**27.** ''වල්ලික් කණවන් පෙයරයි වළිප්පොක්කන් සොන්නාලුම් උල්ලම් කුළෙයුතඩී කිළියේ ...'' යන ගීතයේ කොටස ඇතුළත් වී ඇත්තේ,

(1) කීර්තනම්හි ය. (2) පදම්හි ය.

(3) කාවඩිචින්තුහි ය. (4) ශබ්දම්හි ය.

(5) තිරුප්පුහල්හි ය.

**28.** භරතර්ගේ වර්ගීකරණය අනුව සන්චාරි භාවම් යන්නෙන් අදහස් කරනු ලබන්නේ,

(1) ස්ථිර බව ය.

(2) හැඟීම් ප්‍රකාශය ය.

(3) වචන ප්‍රකාශය ය.

(4) ශාරීරික අංග චලන ය.

(5) අස්ථිර බව ය.

[හතරවැනි පිටුව බලන්න

**29.** වීර රසයේ, දෙවියන්, වර්ණය සහ විරුද්ධ රස පිළිවෙළින් සඳහන් වරණය කුමක් ද?

(1) සිවන්, නිල් පාට සහ ශෘංගාරම්

(2) ඉන්දිරන්, ලා රතු සහ භයානගම්

(3) බ්‍රහ්මා, කහ පාට සහ රෞද්‍රම්

(4) ඉන්දිරන්, කළු පාට සහ වීරම්

(5) රුද්‍රන්, රතු පාට සහ භයානකම්

**30.** භරත නර්තනය සඳහා භාවිත කරනු ලබන නට්ටුවාංගම් තාල වාද්‍ය භාණ්ඩය සාදා ගැනීම සඳහා භාවිත වන ලෝහය කුමක් ද?

(1) යකඩ සහ ඇලුමිනියම් (2) තඹ සහ යකඩ

(3) ලෝකඩ සහ ඇලුමිනියම් (4) යකඩ සහ ලෝකඩ

(5) තඹ සහ ලෝකඩ

**31.** විගුරුෂ්ටම්, චතුරස්‍රම් සහ තිරියසිරම් යන්න අයත් වර්ගය මොනවා ද?

(1) අරංග (2) නිරුත්ත (3) ආභරණ (4) වාචික (5) නාට්ටිය

**32.** සංගීත භාණ්ඩවල සමෙන් කළ භාණ්ඩය වන්නේ,

(1) මුඛවීණා ය. (2) සේමක්කලම් ය. (3) තප්පු ය. (4) හාර්මෝනියම් ය. (5) ජාල්රා ය.

**33.** තාලදසප්‍රාණන්හි උපප්‍රාණයක් වන්නේ,

(1) ක්‍රියා ය. (2) ග්‍රහම් ය. (3) අංගම් ය. (4) ප්‍රස්ථාර ය. (5) මාර්ගම් ය.

**34.** තාලයේ ආරම්භය සහ ගීතයේ ආරම්භය එකම අවස්ථාව තිබීම හඳුන්වන්නේ,

(1) අතීත ලෙස ය. (2) සම ලෙස ය.

(3) අනාගත ලෙස ය. (4) දෘත ලෙස ය.

(5) අනුදෘත ලෙස ය.

**35.** මකරි, කොඩිබුවා, පන්ත ක්‍රිත්තියාගේ පඩෙක්කල, ඔරිස්සාවටම හිමි සෙන් යන සම්ප්‍රදායන් සම්මිශ්‍රණයෙන් නිර්මාණය වී ඇති ශ්‍රාස්තීය නර්තනය වන්නේ,

(1) කතක් ය. (2) භරත නාට්ටියම් ය. (3) මණිපුරි ය.

(4) කතකලි ය. (5) ඔඩිසි ය.

**36.** ශාන්ති කුතුවල පළවෙනි කොටස වන සොක්කම්වල ප්‍රවීණයෝ වන්නේ,

(1) තළියිලාර් සහ පතියිලාර් ය.

(2) නිරුත්තවිඩංකියර් සහ තලිර්ච්චේරි කාන්තාවන් ය.

(3) පදියිලාර් සහ නිරුත්තමාරායර් ය.

(4) නිරුත්තවිඩංකියර් සහ නිරුත්තමාරායර් ය.

(5) තළියිලාර් සහ නිරුත්තමාරායර් ය.

**37.** මයිලාපූර් ගෞරි අම්මාගෙන් 'ශරසි ජාක්ෂුලු' යන ශබ්දය ප්‍රථම පාඩම වශයෙන් ඉගෙනගත් පුද්ගලයා වන්නේ,

(1) කලෙයිමාමණි රුක්මණිදේවි අරුන්ඩේල් ය.

(2) අභිනය අරසි බාලසරස්වතී ය.

(3) පන්දනෙ නල්ලූර් සබාරන්ජිතම් ය.

(4) සොක්කම්මාල් ය.

(5) පන්දනෙ නල්ලූර් ජයලක්ෂ්මි ය.

**38.** 1996 වර්ෂයේ යාපනයේ රාමනාදන් ලලිත කලායතනය වෙන් කරනු ලැබූ ද්විත්ව අංශ වනුයේ,

(1) නර්තන අංශය සහ නාට්‍ය අංශය ලෙස ය.

(2) චිත්‍ර හා නිර්මාණ අංශය සහ සංගීත අංශය ලෙස ය.

(3) සංගීත අංශය සහ නර්තන අංශය ලෙස ය.

(4) නාට්‍ය අංශය සහ සංගීත අංශය ලෙස ය.

(5) නර්තන අංශය සහ චිත්‍ර හා නිර්මාණ අංශය

**39.** සංචාරි භාවම්හි උප හැඟීම්වල 'ස්මෘති' යන්නෙන් අදහස් කරනු ලබන්නේ,

(1) ශෝකය වේ. (2) අවමානය වේ. (3) අහංකාරය වේ. (4) අසනීපය වේ. (5) මතකය වේ.

**40.** සබරගමුව නර්තන සම්ප්‍රදායේ දෙවියන් සඳහා කරනු ලබන නර්තනය වනුයේ,

(1) පට්ටුදල් මාත්‍රය වේ. (2) යක් පදය වේ.

(3) යාදිනි මාත්‍රය වේ. (4) මුල් මාත්‍රය වේ.

(5) සින්දු මාත්‍රය වේ.

**41.** සහාජි රජතුමා, නායකයා ලෙස සළකා දමිළ බසින් ගීත ගායනා කරන ලද්දේ,

(1) පාපනාසම්සිවන්, කවිකුන්ජරභාරතියාර් සහ සෙෂරංජර් විසින් ය.

(2) වාසුදේවකවි, පන්චිනතම් රාමභාරති සහ මුත්තුකවිරායර් විසින් ය.

(3) ඌත්තුක්කාඩු වෙංකඩ සුප්පෙයර් සහ කනම් ක්‍රිෂ්ණ අයියර්, මුත්තුත්තාණ්ඩවර් විසින් ය.

(4) රාමලිංග ස්වාමිහල්, තේසික් විනායකම්පිල්ලෙ සහ සිතම්බරභාරතියර් විසින් ය.

(5) සුබ්‍රමණිය භාරතියාර්, පෙරියසාමිදූරන් සහ මුත්තුත්තාණ්ඩවර් විසින් ය.

**42.** සාත්වික අභිනයෙහි 'ස්වේතම්' යන්නෙන් අදහස් කරනු ලබන්නේ,

(1) කලන්තය වේ. (2) කටහඬේ වෙනස වේ. (3) වෙව්ලීම වේ.

(4) දහඩිය දැමීම වේ. (5) කඳුළු සැලීම වේ.

**43.** 'අභිනය අරසකේසරී' යන ගෞරවනාමයෙන් පිදුම්ලද නර්තන ශිල්පියා වන්නේ,

(1) කලෙච්චෙල්වන් ඒරම්බු සුප්පෙයියා ය.

(2) බ්‍රහ්ම ශ්‍රී වීරමණි අයියර් ය.

(3) ගීතාංජලී වී.කේ. නල්ලයියා ය.

(4) එන්. රාජරත්ණම් ය.

(5) කේ. තොම්මක්කුට්ඩි ය.

**44.** නායකයා විසින් නායිකාවට ද්‍රෝහිකම් කිරීමෙන් පසු ඇයගෙන් සමාව ඉල්ලා සිටින ස්වාමියාට සරදම් කරන නායිකාව වන්නේ,

(1) කලකාන්තරිතා ය. (2) අභිසාරිකා ය.

(3) ස්වාදීනපතිකා ය. (4) වාසකජ්ජිතා ය.

(5) කණ්ඩිතා ය.

**45.** තිරුමාල් දෙවියන්ගේ දුන්නේ තත්වලින් විහිදුණු නාදයෙන් නිර්මාණය වී ඇති විරුත්තිය වන්නේ,

(1) සාත්වතී ය. (2) ආරබඩි ය. (3) කෛසිකි ය. (4) භාරති ය. (5) උත්තාපක ය.

**46.** කිටතකතරිකිටතොම් කිටතකතරිකිටතොම් කිටතකතරිකිටතොම් යන යදි නිර්මාණය වන්නේ,

(1) කෝපුච්ච යදි ය. (2) විෂම යදි ය. (3) ඩමරුක ගදි ය.

(4) පිපිලික යදි ය. (5) මිරුදංග යදි ය.

**47.** එකලොස් වාර්ගික නර්තනයෙන් උමයමල් විසින් ඉදිරිපත් කරන ලද නර්තනය වන්නේ,

(1) පේඩි වේ.

(2) මරක්කාල් වේ.

(3) පාවෛ වේ.

(4) කොඩුකොට්ටි වේ.

(5) තුඩි වේ.

**48.** පාද බේදවල අත්දෙක ඉනේ තබාගෙන පාද දෙක එකට තබා සිටගෙන සිටින ක්‍රම ඇතුළත් කාණ්ඩය වන්නේ,

(1) සරණම්, ගාරුඩම් සහ ප්‍රේරිතානි ය.

(2) ආයත, බ්‍රමරී සහ ඒකපාද ය.

(3) උත්ප්ලවන, සමසූචි සහ මෝටිත ය.

(4) ග්රිපාල, අලක සහ කුට්ටණ ය.

(5) මණ්ඩල, ස්ථානක සහ සමපාද ය.

**49.** සදිර් සහ දාසි ආට්ටම් යන නමින් හඳුන්වන ලැබූ දමිළ ශාස්ත්‍රීය නර්තනය 'භාරතනාට්ටියම්' ලෙස හැඳින්විය යුතු බව ප්‍රකාශ කළ කෙනෙකු වන්නේ,

(1) ඊ. ක්‍රිෂ්ණ අයියර් ය.

(2) රාමසාමි නායක්කර් ය.

(3) නාරායණ අයියර් ය.

(4) මුත්තුලක්ෂ්මි රෙඩ්ඩි ය.

(5) රාජගෝපාලච්චාරියර් ය.

**50.** 'ඩොල්චන්ද්‍ර' යන උත්සව චාරිත්‍රය ඇතුළත් ශාස්ත්‍රීය නර්තනය වන්නේ,

(1) ඔඩිසි ය.

(2) කතකලි ය.

(3) මණිපුරි ය.

(4) මෝහිනි ආට්ටම් ය.

(5) කතක් ය.

* * *

More Past Papers at
tamilguru.lk